# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2182/14 – 2020 ජූනි 30 වැනි අඟහරුවාදා – 2020.06.30**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/COM/01/2018/26.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

**4 (1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම**

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2019.04.03 වැනි දින අංක 2117/28 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.03.26 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම.(වයි. එල්. කල්‍යාණිලතා මිය වෙනුවෙන්)

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ඇගියෝ ටුබැකෝ පොසෙසින්ග් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්, නිදහස් වෙළඳ කලාපය, බියගම.

අතර පවත්නා 2019.03.09 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඕබඩගේ ලීලාරත්න මහතා වෙත යොමු කරන ලදී.


1A – G 32407 – 21(2020/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මා එම නියෝගය අවලංගු කරන අතර, එකී 2019.03.26 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2020 අප්‍රේල් මස 20 වැනි දින,
කොළඹ දී ය.

07 - 398/1

---

මගේ අංකය: IR/COM/01/2018/26.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම.(වයි. එල්. කල්‍යාණිලතා මිය වෙනුවෙන්)

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ඇගියෝ ටුබැකෝ පොසෙසින්ග් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්, නිදහස් වෙළඳ කලාපය, බියගම.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කළුතර, නාගොඩ, ශ්‍රී සෝභිත මාවත, අංක 242, ඕබඩගේ ලීලාරත්න මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2020 අප්‍රේල් මස 20 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2018/26.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම.(වයි. එල්. කල්‍යාණිලතා මිය වෙනුවෙන්)

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ඇගියෝ ටුබැකෝ පොසෙසින්ග් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්, නිදහස් වෙළඳ කලාපය, බියගම.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''2017.12.21 දින සිදු වූ සිද්ධියක් හේතුකොටගෙන පවත්වන ලද විනය පරීක්ෂණයකින් අනතුරුව 2018.07.07 වැනි දින සිට 2018.07.13 වැනි දින දක්වා දින 6ක් සේවය අත්හිටුවමින් වැටුප කපා ගැනීම නිසා වයි. එල්. කල්‍යාණිලතා මිය වෙත අසාධාරණයක් සිදුවී තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද'' යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 - 398/2

---

මගේ අංකය : IR/COM/04/2017/54 - i.
IR/COM/04/2017/219.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

**4 (1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම**

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2019.04.03 වැනි දින අංක 2117/25 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.03.26 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ජයන්ත තිරාණගම ඇතුළු සේවක පිරිස, දනවල, නෙළුව.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

තේ ශක්ති අරමුදල, 8 වන මහල, සෙත්සිරිපාය, II වන අදියර, බත්තරමුල්ල.

අතර පවත්නා 2019.03.14 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එස්. කාරියවසම් මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මා එම නියෝගය අවලංගු කරන අතර, එකී 2019.03.26 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2020 අප්‍රේල් මස 03 වැනි දින,
කොළඹ දී ය.

07 - 399/1

---

මගේ අංකය : IR/COM/04/2017/54 - i.
IR/COM/04/2017/219.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ජයන්ත තිරාණගම ඇතුළු සේවක පිරිස, දනවල, නෙළුව.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

තේ ශක්ති අරමුදල, 8 වන මහල, සෙත්සිරිපාය, II වන අදියරය, බත්තරමුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බදුල්ල, සිල්වර්ලෑන්ඩ්, හිඟුරුගමුව පාර, ''සෞම්‍යා'', අංක 417, ඩී.එම්.කරුණාරත්න මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2020 අප්‍රේල් මස 03 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය : IR/COM/04/2017/54 - i.
IR/COM/04/2017/219.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ජයන්ත තිරාණගම ඇතුළු සේවක පිරිස, දනවල, නෙළුව.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

තේ ශක්ති අරමුදල, 8 වන මහල, සෙත්සිරිපාය, II වන අදියර, බත්තරමුල්ල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''තේ ශක්ති අරමුදල සතු කම්හල් වසා දැමීමේ හේතුව මත තේ ශක්ති අරමුදලේ සේවය කළ ජයන්ත තිරාණගම මයා ඇතුළු පහත නම් සඳහන් සේවකයින් 08 දෙනාගේ සේවය 2016.12.31 දින සිට අවසන් කිරීමේදී වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට අවස්ථාව තිබියදී විශ්‍රාම යැවීමේ වයස අවු. 55 ලෙස සලකා වන්දි ගණනය කිරීම මගින් අසාධාරණයක් සිදුවී තිබේද? එසේ සිදුවී තිබේද නම් ඔවුනට ලැබිය යුතු සහන කවරේද'' යන්න පිළිබඳව වේ.

| | | |
|---|---|---|
| 01. | ජයන්ත තිරාණගම | 05. පසන් වටවල |
| 02. | ඒ.ඩබ්. කුමාරසිරි | 06. ප්‍රියන්ත බාලපටබැඳි |
| 03. | එම්. පී. නීතා රත්නකුමාරි | 07. ඩබ්. එම්. ධර්මසිරි |
| 04. | එම්. කේ. අනුර සරත් කුමාර | 08. ඩබ්. ඩබ්. සී. සී. කුමාර |

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජනවාරි මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 - 399/2

---

මගේ අංකය : IR/COM/02/B/2015/02.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

**4 (1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම**

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2019.02.14 වැනි දින අංක 2110/39 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.02.07 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්. පී. ආනන්ද සාගර මයා, අංක 8/4 ඒ, අන්නාසිවත්ත, හල්ගම්පිටිය, කලගෙඩිහේන.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

අතර පවත්නා 2019.01.23 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පී. නවරත්න මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මා එම නියෝගය අවලංගු කරන අතර, එකී 2019.02.07 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2020 මාර්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

07 - 400/1

---

*මගේ අංකය*: IR/COM/02/B/2015/02.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්. පී. ආනන්ද සාගර මයා, අංක 8/4 ඒ, අන්නාසිවත්ත, හල්ගම්පිටිය, කලගෙඩිහේන.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බදුල්ල, සිල්වර්ලෑන්ඩ්, හිඟුරුගමුව පාර, ''සෞම්‍යා'' අංක 417, ඩී. එම්. කරුණාරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2020 මාර්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

*මගේ අංකය*: IR/*COM/02/B/2015*/02.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්. පී. ආනන්ද සාගර මයා, අංක 8/4 ඒ, අන්නාසිවත්ත, හල්ගම්පිටිය, කලගෙඩිහේන.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආරක්ෂක නියාමකවරයකු ලෙස 1987.02.10 දින සිට සේවය කරන ආර්. පී. ආනන්ද සාගර මහතා 2008.05.05 දින සේවා නිමා වී ඔහුට අයත් වාහනයෙන් තමා ඇතුළු 04 දෙනෙකු සේවා ස්ථානයෙන් පිටව යාමේදී එම වාහනයේ අනවසර භාණ්ඩ තිබී සොයා ගැනීම සම්බන්ධයෙන් එක් අයෙකු ඉවත්කර 03 දෙනෙකුට පමණක් අභ්‍යන්තර විනය පරීක්ෂණයක් පවත්වා දෙදෙනෙකුට නැවත සේවය ලබා දී පැමිණිලිකරු පමණක් සේවයෙන් ඉවත්කර ඇති අතර එම සිද්ධියටම අදළව පැමිණිලිකරු ඇතුළු 03 දෙනෙකුට කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණයේ පැවරූ නඩුවෙන් චූදිතයින් 03 දෙනාම නිදෙස් කොට නිදහස් කිරීමෙන් පසුව හෝ පැමිණිලිකරුට පමණක් නැවත සේවය ලබාදීමට සේවායෝජක පාර්ශ්වය කටයුතු නොකිරීමෙන් පැමිණිලිකරුට අසාධාරණයක් සිදුව ඇද්ද යන්න සහ එසේ නම් ඔහුට හිමිවිය යුතු සහන කුමක් ද යන්න පිළිබඳ වේ''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 - 400/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.